# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2140/2 - 2019 සැප්තැම්බර් මස 09 වැනි සඳුදා - 2019.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) වැනි ව්‍යවස්ථාවට හා 46(1) (අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 2103/33 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව, වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2019 සැප්තැම්බර් මස 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (1) ''ආරක්ෂක අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 21 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

22. ජාතික ආරක්ෂාව තහවුරු කරමින්, ජනතාව අතර සාමය, සමගිය සහ සංහිඳියාව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතයෙන් වර්ධනය කිරීමටත්, අතිනවීන තාක්ෂණය යොදා ගනිමින් ජනතාවගේ රසඥතාවය වර්ධනය කිරීම හා උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහාත්, අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 22 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි 21 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

22. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන ''ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)'' ට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1982 අංක 6)

---

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 2103/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව, වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2019 සැප්තැම්බර් මස 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මෛත්‍රීපාල සිරිසේන,**
ජනාධිපති.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (6) ''ජනමාධ්‍ය අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි 4 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි අයිතම 3 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන ''ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1982 අංක 6)'' ඉවත් කිරීමෙන්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.